# ධර්ම සන්නිවේදනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

දේවාලේගම මේධානන්ද හිමි

Dhammadesana, Buddhist preacing is the principal technique used by the sermonizers (Dhammakatika) both clergy and laity, to disserminate Buddhist teachings to the masses. The Buddha was profoundly concerned with communicating Damma precisely, clearly and creatively. The subject matter of the present article is to introduce some of the preaching methods of the Buddha with reference to canonical and commentarial sources. What is discussed specially herein is Buddhist ways of communication through preaching to acknowledge the masses more effectively.

මුලික පාලි සූත්‍රාන්තයන්හි නිතර සඳහන් වන පරිදි බුදුරදුන්ගේ දහම් දෙසීම ද ශ්‍රාවකයන්ගේ දහම් ඇසීම ද ඉතාමත් වැදගත් සත්ක්‍රියාවන් වන්නේය. ඒ තථාගතයෝ මුල මැද අග යහපත් වූ අර්ථ ව්‍යඤ්ජන සහිත වූ ධර්මය දේශනා කරති. හැම අතින්ම පිරිපුන් වූ ද, පිරිසිදු වූ ද බඹසර ප්‍රකාශ කරති. ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ ඒ ධර්මය අසයි. බුදුරදුන් කෙරේ ශ්‍රද්ධාව උපදවයි. හෙතෙම සැදැහැයෙන් යුක්ත වූයේ ගෘහ ජීවිතයේ අනේකවිධ සම්බාධක දක පැවිදි වෙයි. දහම් මග යයි.[1] මේ අනුව සාසන බ්‍රහ්ම චර්යාවට මුල් වන්නේ දහම් ඇසීමය. එය නිවන් මගට ද මුල්වෙයි.[2] බුදුරදුන් විසින් පන්සාළිස් වසක් වූ සිය ජීවිතය පුරාම නොයෙක් තන්හි ගිහි පැවිදි නොයෙක් සිය දහස් ගණින් ප්‍රජාවට දහම් දෙසන ලද්දේය. එමගින් ඔවුනට මෙලොව අභිවෘද්ධිය ද, පරලොව සුගතිය ද, නිවන් සුවය ද සාදාදෙන ලද්දේය. බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවෝ ද එලෙසින්ම ක්‍රියා කළහ. ඒ බව සූත්‍රාන්තයන්හි නිබඳවම කියැවෙයි. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිය සිව්වනක් ශ්‍රාවක පිරිසම ඇවෑ ධර්මදේශනයෙන් යුතුව දහම් දෙසන්නවුන් වනු දක්ම බුදුරදුන්ගේ අපේක්ෂාව වූ බව පැරණි මූලාශ්‍රවල දක්වෙයි.